සුබස් සිතිවිලි

වි ක ධර්මබන්ධු

ලෝක කෝප්පය නොහොත් හතර හිනාව

"මං හෙට බොලෑ ගෙදර එනවා: අනිද්දා: යාපනේ යන්න උඹත් සූජානං වෙලා: හිටහං" මේ කතාව අහං ඉන්න මාරය: හිනා වෙනව:ලු.

"මේ කොස් ගහ අය්ති මගේ ඉඩමට."

"මේ කොස් ගහ ? මේක බෙදලා: වෙං කරපු ඉඩමක් නෙවි. උඹ කොහොම ද මේ කොස් ගහ උඹෙය් කියන්නේ ?"

"ආ එහෙමද ! හොඳයි එහෙනං වරෙංකො නා ගෙන කොස් කඩන්න"

"හොඳයි මලේ මං නාලා: නෙවි - ල ම එන්නං" මේ හබේ අහං ඉන්න මිහිකත (පොලෝ මහී කාන්තාව) හිනා වෙනව:ලු



"මගේ රත්තරං පුතා - මගේ පන - මගේ ඇස් දෙක - මගේ කට - මගේ නාහෙ අපෙ අම්ම:ගෙ" සැමියා තම පුතා හුරුතල් කරනු අසන බිරිය දෙරට මුවා වී අතින් කට වසා ගෙන හිනා වෙනව:ලු

ඔය හිනා තුනට තවත් හිනාවක් එකතු උනාම ලු හතර හිනාව හැදෙන්නෙ.

මේ ඉරිදා: (03/04/11) ඕස්ට්‍රේලියාවෙ ලංකා චැනලය බලං ඉන්න ගමං ඒකෙ තිබුනු නාඩගං දැක්කම - කතා ඇහුව:මය් මට ඔය හතර හිනාව මතක් උනෙ. අපේ ඇත්තෝ උඩ ලාපු තරම දැක්ක:ම මට නිකමට හිතුන: හෙට ඉරිදා: අපට හතර හිනාව අහන්න ලැබෙය් ද කියලා: හරියට ම හරි. ඒක සිද්ද උනා. මං කට ඇරියෙ නෑ. මොකො ද දන්නව: ද? අපේ තියෙනවලු නේ ඇස් වහ කට වහ හෝවහ කියලා: තුනක්.

මට හිතෙන විදියට 'වහ' වෙලා: තියෙන්නෙ 'වස' ම වෙනටෑ. 'වහ' කියන්නෙ කන, කවන, දෙන එකක් උනාට මෙතන -ඇස් වහට - ඇස් වහ අරං, කට වහට - කට වහ අරං" කියලා: ය් බහවිතා වෙන්නෙ හෝවහ ගැන මං මොකුත් දන්නෑ. ඇස් වහ පිට අයට පේන්නෙවත් දැනෙන්නෙවත් නෑ. කට වහ වචන වලිනං පිට වෙන හින්දා: පිට අයටත් ඇහෙනව: තනියම දෙඩන කතා කරන සිරිතක් අපේ නෑ නේ. ඔල්මාද කාරයො තමය් තනියෙං දෙඩන්නෙ. දකුනෙ අපි ඒකට කියන්නෙ දො-ඩවනවා: / දොඩෝනව: කියලා:ය්.

මගේ අදහසේ හැටියට නං අපට ඇති වෙන්නෙ -සිත් වස" එහෙමත් නැත්තං - හිත්වහ". හිත් වහ ඇති උනාම යමක් දිහා අමුතු විදියට බලං ඉන්නව: එහෙම නැත්නං කටකැඩි කතාවක් කියනවා: ඒව: වෙන්නෙත් කෙරෙන්නෙත් හුඟක් වෙලාවට ඉරිසියාවට කියලය් මට හිතෙන්නෙ.

ඕනම වැඩකදි දිරිමත් කිරීම තල්ලුවක් දීම, උසිගැන්වීම නිසා ඒ වැඩේ කරන කෙනාගෙ හිත දැඩි වෙනව:; චුන් වෙනවා:; දිරිමත් වෙනව:

අපි මේ වගේ සිද්දියක් ගැන හිතමු.

දවසක් රෑ දෙගොඩ හරිජාමෙ අපේ ලොකු මාම: සර්පයෙක් කෑව: ඒකට බේතට කැලේ වැදිලා: බේත් ගහක කොල ටිකකුත් කඩං එන්න ඕන. ඒ වැඩේ කරන්න එතන හිටියෙ පොඩි මාමයි හිමාමාමයි දෙන්න: විතරයි. කවිරුත් ඒ දෙන්න: දිහා බැලුවා: ඒ දෙන්නත් කවුරුවත් කියනකං හිටියෙ නෑ. හුලු අතු දෙකක් පත්තු කර ගෙන පිටත් වෙන්න හදන කොට පොඩි නැන්ද: පොඩි මාම:ට අනතුරු ඇඟෙව්ව: කැලේ දිවිමකුලුවො නයි පොලොංගු ඉන්නව: ටිකක් පරෙස්සමෙං යන්න කියලා: එතකොටත් හිමිමාම: යාර සීයක් විතර දුර ගිහිං. හිමිමාම: කඟවේන: වගේ කැලෑ වැදුන: පොඩි මාමා හරියට කනමදා වගේ ගාට ගාට නැවති නැවති බයිංබයේං තමය් ගියෙ: විනාඩි දහයක් ගියේ නෑ. හිමිමාම: බේත් කොල මිටියක් ම ඉහ තියා ගෙන ගෙට ගොඩ උන:

පොඩි මාම: නෑ නැන්ද: හුල්ල හුල්ල පාර දිහා බලා ගෙන ඉන්න කොට කරුවලේ කුන්දු ගහ ගහ ආපු පොඩි මාම: -හුලු අත්ත නිව්න:; කටු අත්තකුත් පැටලුන:" කියා ගෙන පඩිය උඩ වාඩි උන:

කදරුත් හිමිමාම: චුන් කලේ නං නෑ. ඒ උනාට ඒ වැඩේ කොහොම හරි කරන්න ඕන කමක් - හිතක් හිමිමාම:ට තිබුන:- පොඩි මාම:ටත් මුලදි ඒ වගේ හිතක් තියෙන්න ඇති. ඒ උනාට පොඩි නැන්ද:ගෙ කට හින්ද: පොඩි මාම: ගෙ හිත බාල උනා. ඒක හින්ද: උන්දෑ පනු බෑව: එද රෑඅපට සිද්ද උන: ලොකු මාම:ටය් පොඩි මාම: ටය් දෙන්න:ටම බේත් බඳින්න.

මේ කතාව ඇත්ත සිද්දියක් මුල් කරගෙන ගොතාපු කතාවක්. මේ ඇත්තන්ට මං කියන හරුපෙ තේරුං ගන්න ලේසි වෙන්නය් මං මේක කීවෙ.

සෙනසුරාදා: (02/04/11) ලංකා චැනලයෙ දැකපු දේවල් අහපු දේවල් මතක් වෙන කොට "ඇගේ මාලු නටනව" වගේ දැනෙනව:

ආගමකිං කෙරෙන්න ඕන කාරිය තමය් මිනිස-"සුන්නෙ හිත පිරිසිදු කරන එක. ඒක අපිරිසිදු වෙන්න නොදී රැක ගන්න එක. ඔව්ං කන්නෙ මස් ද කොස් ද බොන්නෙ ලිං වතුරද ගං වතුරද කියලා: අහලා: "හා හා මස් නං කන්න එපා; කොස් කන්න, ගං වතුර නං බොන්නෙ-පා; ලිං වතුරම බොන්න." අනුසාසනා කරන එක තේරුමක් නෑ. පැවිදි පැවැත්මය් ගිහි පැවැත්මය් එකක් නෙවිනේ. දෙකක්. සාමි දරු-වෝ කවදාවත් මුදු යනවයැ; කුකුල්ලු හදනවයැ; ආගමේ නාමෙං ශාස්තරුන් වහන්සේගෙ නම විකුනං කන එක තමං විද්‍යාව තේරුං නොගෙන අවිද්‍යාව වපුරන එක අපරාදයක්. රජ්ජුරුවො තමන්නෙ පැවැත්මට පැවිද්දෙ පුම්බනව: පැවිද්දො තමන්නෙ පැවැත්මට රජ්ජුරු-වො පුම්බනව: මිනිස්සුන්ට තියෙන්නෙ ලබා උපන් හැටියට ඉන්න එක විතරයි.

එක්තරා සාමි දරුවකු අපවත් වීම සැමරීමේ උත්සවයක් දවසෙ රෑ කොළඹ තිබුනු සංගීත සාජේකට කඩා වැදුනු සර්දවන්ත ශ්‍රාවකයො කල හදිය මතක් වෙන කොට නං බයේ බෑ. හැබැයි හොඳ වෙලාවට එද හනිමුං ගිහිං හිටපු ජෝඩු රෑ නැවතිල: හිටපු හෝටල් ගැන ඒ සර්දවන්තයන්ට මතක් උනේ නෑ.

"අපි මෙහේ නැහි ගෙන සෝක උත්සව පවත්තනව:; මුන්ට මඟුල් විසේ; හිටපියව් තොපට මඟුල් කරවන්න" කියලා: ඒ ඇත්තන්ට හිතුන: නං එද කොළඹ හෝටල් කීපයක් බිමට සමතලා වෙන්න තිබුන: එච්චර විතරක් නෙවි; මඟුල් ජෝඩු වලට හනිමුන් කල්තියලා: ඉස්පිරිතාලෙ ලගින්නත් තිබුන: තෙන්නකොන් කිව්සුරා ඔය මෝඩ බක්තිය ඇඳින්නුවෙ -බැති මත" කියලා: මට නං හිතෙන්නෙ ඕක බැති මත නෙවි; බැති විසේ;

එද - සෙනසුරාදා: එක්තරා නැකතියෙක් / ජෝතිශ්ශාස්තුඥයෙක් කිව්ව: එද ලංකාවට බලවත් ජය යෝගයක් තියනවාය. අපේ කොල්ලො ලෝක කෝප්පෙ ගේනව: ගේනව-ාමය් කියලා: සිරි මා බෝදිය අබ්යස කරපු යාතිකාවක් / කන්නලව්වත් බෙල්ලංවිල පන්සලක කරපු පුජාවත් ගැන කතා කරලා: බැති විසේට ගොදුරු වෙන්න මං කැමති නෑ. කොහොම උනත් මට එද හිතුනෙ ඒ වෙන කොටත් කෝප්පෙ ලංකාවට ලැබිච්ච විදියට.

ක්‍රිස්තියානි, හින්දු, ඉස්ලාම් පුජක වරු උදසීනව, නිහඬව හිටි හැටි දැක්ක:ම මට අපි ගැන කලකිරීමක් තරහක් වේදනාවක් ඇති උනේ ඇය් ? ඒ පුජකවරු කුලියට සපෝරු නුන එක, බලල් අත් නොවි තමන්ට අය්ති කාරිය කර ගෙන හිටි එක හරි කියලය් මට හිතෙන්නෙ.

එද අපේ කොල්ලො දිනුව: නං මාත් කිරිබත් උයනව: කනව: ඒත් මං කලිං කිරිබත් උයලා: පෑගාලා: මේසෙට ඇරලා: පිලු වෙන්න තියන්නෙත්නෑ. අනුසුරතාවෙ වැඩිය හොඳය් කියලා: පිලුං කිරිබතට සීනිත් දැගෙන කන්නෙත් නෑ. ඊයෙ ලකුනු සීයක් ගත් ක්‍රීඩකය: අද පලමුවැනි බෝලෙං දැවී යන්න පුලුවං. ඊයෙ බින්දුවෙං දැවී ගිය ක්‍රීඩකය: අද සීයක් ගන්න පුලුවං. ක්‍රිස්තියානි පුජකයො නියෝජනය කරන්නෙ ජේසු / දෙය්යො; හින්දු පුජකයා නියෝජනය කරන්නෙ දෙය්යො; ඉස්ලාම් පුජකයා නියෝජනය කරන්නෙ දෙය්යො / අල්ලා. හාමු දුරුවො නියෝජනය කරන්නෙ බුදුන්. බුදුන් හෑල්ලු කිරීම හරි වැඩක් නෙවි. අපි නොදන්න දේවල්, බුදු හාමුදුරුවො නොදන්න දේවල් පර්නමාලිගා ඇතුලෙ කොච්චර වෙනව:ද !

මායියෙක් නැති අරුමෙ මට දැන් දැනෙන්නා

"ඕන් වැස්ස කඩා පාත් වෙනවා.. දක්කපිය විගැහින් හේන් ඉම තියෙන පලු ගහ යටට.."

ට්‍රැක්ටරයේ එල්ලී සිටි කොලු ගැටයාට අවනත වෙමින් මම ට්‍රැක්ටරය ගස යටට කර නැවැත්තුවෙමි. ඈතින් ඇසුණ වැස්සේ හඬ දැන් අප පසු කර යන්නට සැරසෙයි.

කඩින් කඩ වැසි ඇද වැටීම මේ කාලයට අරුමයක් නොවුණත් හේන් ගොවිතැනට මෙය බාධාවකි.

කොලුවා බුලත් විට හපන අතර මා හා දොඩමලු විය. ඔවුන්ගේ හේන් ජීවිතය ගැන තොරතුරු මා සමග පවසමින් සිටි අතර ගොරහැඩි හඬකින් මේ කවිය මගේ දෙසවන කරා ආවේ අසළ වූ හේනේ පැල් කොටය තුළිනි.

අඳුරු බබා වැහි පිට වැහි වැටෙන්නා
පඳුරු දදා වැල් කුඩු මැටි තැනෙන්නා
මෙදත් මගෙ කුඹුර නෙළුමෙන් ඇරෙන්නා
මායියෙක් නැති අරුමෙ මට දැන් දැනෙන්නා

මා නිහඬව කන් දී සිටිනු දැක කොලුවා මෙසේ දෙඩුවේ ය.

"ඒකගෙ අඩහැර උඹේ කන්හොරැව්වට දිගේලි වුනා ද? උඹල දන්නෑ ඕකා පැල් ගැහෙන්ට උන්න නෑම්බ් වලහ බරු ගහලා වළ පල්ලට දෙරි ගැහිලා කන්න තුන හතරක් ඇති මයෙ හිතේ. ඒක හඳුන්පොතේ හිර කොරාන ඕකා තනි පංගලමේ පැල් කොටේ ලගින්නෙ.. කැලේ දෙයියො මොකට මේ නපුර වෙකම් බලා උන්නෙ..? ඕං වැස්ස නැතුවා.. මහතැන් කරුවලන පාත්වෙන්ට කලින් යම.."

බෝගල